## ලකුණ

# මැතිවරණයේ අනතුර!

**ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය හා පාර්ලිමේන්තුව නොව රට බාහිරව ඇති සිංහල බලවේගයත් රට නායකත්වය දෙන මහාසංඝරත්නයත්, සිංහල බෞද්ධ ජාතිකත්වයට හිමි තැන දිනා ගැනීමට නිබඳව අරගලයක නියැලී සිටින බව නොවේද මෙයින් සනාථ වන්නෙ. 56 ජාතික පිබිදීම හරහා බලයට පත් නව ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිකම බරගන්නැයි කළ ආරාධනාව මෙත්තානන්ද මහතා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවේ ලංකාවේ ජාතික සටනට අනුග්‍රහයක් උදදව්වක් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයෙන් හෝ පාර්ලිමේන්තුවෙන් නොලැබෙන බව වටහාගෙන විය යුතුය.**

**ලක්ෂමන් පියසේන**

ලොකුසතු හේවගේ මෙත්තානන්ද හෙවත් එල්. එච්. මෙත්තානන්ද මහතා 1967 නොවැම්බර් පළමුවැනිද අභාවප්‍රාප්ත වන විට, ලංකාවේ සැබෑ ජාතික නායකයකු ලෙස පෙරට පැමිණ සිටියේය. මෙත්තානන්ද මහතාගේ තිස්හතරවැනි ගුණ සමරුව ඔහු උපන් අම්බලන්ගොඩ ගමේදී අද (4) සමරයි. මේ සැමරීම අතීතයට යා කරමින් ඔහු කළ ජාතික මෙහෙවර ගැන සමකාලීන පුවත්පත් කලාවේදියෙකු වන, සයිරස් ඩබ්ලිව්. සුරේන්ද්‍ර මහතා 1967 නොවැම්බර් 3 ද ලංකාදීප පුවත්පතට ලියන ලිපියක මෙසේ සඳහන් කරයි.

*"... හිතටත් හෘදය සාක්ෂියටත් පමණක් නොව දේශීය හා ජාතික ජීවිතයේ පැහැදිලිව පෙනුණු වුවමනාවන්ටත් එකඟවන සේ ඇත්ත කීමටත් පෙළඹුණු මෙත්තානන්දයෝ සිය ව්‍යාපාරයේ එක් උච්ච අවස්ථාවකදී මෙරට ඔටුනු පමණක් නොපලන් අධිරාජයකු බඳු වූහ. ඔහුගේ ලියන වචන මෙන්ම කියන වචන ද නීතියක් විය යුත්තක් විය. ශතවර්ෂ පහක් තිස්සේ මහා පාළු කාන්තාරයක් මෙන් වියළී ගිය අනාථ අසරණ සිංහල ජීවිතය පලබර වන උයනක් වී එහි තැනින් තැන දහස් ගණන් සුවැඳති මල් පිපෙන්නට පටන් ගත්තේ සිංහල බෞද්ධ උරුමයන් සහ අයිතිවාසිකම් නැති වී ගිය තැන් සහ නැති වී ගිය සැටිත් මෙත්තානන්දයන් විසින් මහ හඬින් සවිස්තරව පෙන්වා දෙන විටය.."*

මෙත්තානන්ද මහතා ජාතික නායකයකු ලෙස පෙරට පැමිණියේ ඔහු අතින් ඉටුවූ කවර ජාතික මෙහෙවරක් නිසා දැයි වටහා ගැනීමට ඒ කෙටි සටහන වුවද සෑහේ. ඔහු ඉතාම පැහැදිලිව පෙනී සිටියේ, සිංහල බෞද්ධ ජාතිකත්වයට රටේ හිමි තැන දිනාගැනීමටත්, ඒ මත රට ගොඩනැගීමටත් ය. කොළඹ ආනන්ද විද්‍යාලයට නව යුගයක් උදාකළ විදුහල්පතිවරයකු ලෙස මෙත්තානන්ද මහතා ජනප්‍රසාදයට ලක්වූයේ, පාසල් ගුරුවරයකු ලෙසද ඔහුට පැහැදිළි ජාතික ඉලක්කයක් තිබුණ බැවිනි. ඒ අන්කිසිවක් නොව සිංහල බෞද්ධ ජාතිකත්වයට හිමි තැන දිනාගැනීමත් ඒ මත පිහිටා රට ගොඩ නැගීමත්ය. ඔහු තම ජාතික ඉලක්කය සපුරා ගැනීම පිණිස ආදර්ශයට ගත්තේ මෙරට සංස්කෘතියට හොඳින් ගැළපුන අනගාරික ධර්මපාල තුමාගේ ගමන්මග මිස, බුද්ධාගම 'ලෝක සංස්කෘතියට' ගැළපූ ඕල්කට් තුමාගේ ගමන්මග නොවන නිසාදේ ඔහුට මුහුණ දෙන්නට සිදුවූයේ සුළුපටු අභියෝගවලට නොවේ. මෙත්තානන්ද මහතාගේ ජාතික මෙහෙවර ගැන විග්‍රයක් කරමින් මහාචාර්ය එල්. ජී. හේවගේ එක් අවස්ථාවකදී මෙසේ සඳහන් කළේය.

*"... අවුරුදු දහයකට ආසන්න කාලයක් ධර්මරාජය ගොඩනැගීමට අමතක නොකළයුතු සේවයක් කොට මෙත්තානන්ද මහතා 1945 දී ආපසු ආනන්දයට පැමිණියේය. මේ වර එහි විදුහල්පතිවරයා වශයෙනි. එතුමා මේ තනතුර භාරගැනීමට පැමිණියේ ආනන්දය ඉතාමත්ම අභාග්‍ය සම්පන්න යුගයෙන් නව යුගයකට ගෙනයාම සඳහා යයි කීමට තරම් තොරතුරු එහි ඉතිහාසය බලනවිට පෙනේ. එතුමා වැඩ භාර ගත්තේ ආනන්දය ඇතුළතත් පිටතත් වචනාර්ථයෙන් මෙන්ම ව්‍යංගාර්ථයෙන් ද ගිනිගෙන තිබුණු අවස්ථාවකය. ඒ මහතා වැඩභාරගැනීමට පැමිණි දිනයේදීම තමා පැමිණි මෝටර්රියට පවා ගල්ගසා තුවාල කළ බව වාර්තා වේ..."*

මෙත්තානන්ද මහතාට එල්ල වූ මේ අභියෝග හමුවේ ඔහු සිය ඉලක්කය අත්නොහැරියේය. සිංහල බෞද්ධ ජාතිකත්වයට හිමි තැන දිනා ගැනීම වෙනුවෙන් පෙළගැසුණු ජාතික බලවේගය තම වුවමනාව එක්තැන් කළ සංධිස්ථානයක් ලෙස, 1956 දී පිහිටුවන ලද බෞද්ධ කොමිෂන් සභාව හැඳින්විය හැකිය. මෙම කොමිෂන් සභාව පත් කරන්නට මූලිකත්වය ගත් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති ධුරයට මෙත්තානන්ද මහතා පත්වීමත්, බෞද්ධ කොමිෂන් සභා වාර්තාව එළිදක්වන්නට ආනන්ද විද්‍යාලය තෝරා ගැනීමත් ඔහු අධිෂ්ඨානශීලීව තම ඉලක්කය හඹා ගිය බවට සාක්ෂි දරයි. ඇත්තටම මෙත්තානන්ද මහතාට ජයගන්නට සිදුවූයේ කවර අභියෝගයක්ද? ඒ අභියෝග, මෙත්තානන්ද මහතා හෝ ඔහු නියෝජනය කළ සිංහල බලවේගය විසින් මුළුමනින්ම ජයගනු ලැබුවාද? කියන කාරණයයි, ඔහුගේ තිස්හතරවැනි ගුණසමරුව සමරණ මේ මොහොතේදී විමසා බැලිය යුතුවන්නේ. රට පෙරවදනක් ලෙස 1956 පෙබරවාරි 4 ද කොළඹ ආනන්ද විද්‍යාලයේදී බෞද්ධ කොමිෂන් සභා වාර්තාව පිළිගන්වන උත්සව සභාව අමතා මෙත්තානන්ද මහතා කළ කථාවේ කොටසක් මෙසේ උපුටා දක්වමි.

*"... ලංකාවේ හැම පෙදෙසකම එකම කතෝලිකයෙක් නැති පෙදෙසක පවා පල්ලි සෑදීමට ආණ්ඩුවෙන් ඉඩම් දී තිබේ. ආණ්ඩුවේ මේ ක්‍රියාවලියට බෞද්ධයන් තදින් විරුද්ධ වෙත්. බෞද්ධ ජනයාගේ දිළිඳුකම, නූගත්කම, අසරණකම තමන්ගේ වාසියට හරවා ගැනීම රෝමානු කතෝලික සභාවේ අයුතු ක්‍රියාවකි. ලේක්හවුස් පුවත්පත් ආණ්ඩුවටද රෝමානුකතෝලික සභාවටද පක්ෂව ක්‍රියා කරති. බෞද්ධයන්ගේ දුක්ගැනවිලි ගැන නොසලකති. එක් අතකින් දිනමිණ, සිළුමිණ. ජනතා යන සිංහල පත්‍ර සංඝයා වහන්සේලා හා සිංහල කථාකරන උදවිය රවටති. අනිත් අතින් ඩේලිනිවුස්, ඔබ්සර්වර් යන ඉංග්‍රීසි පත්‍ර සංඝයාවහන්සේලාට හා සිංහල කථාකරන උදවියට සරදම් කරති. ආණ්ඩුව කතෝලිකයන්ට ආධාර දෙයි. අපේ නායක ස්වාමීන් වහන්සේලාට ආණ්ඩුව අක්තපත්‍ර ප්‍රදානය කරයි. මහජනයා රැස්වෙන අවස්ථාවන්හිදී පෙරහැරවල් ද වෙනත් උත්සව ආණ්ඩුව ජයට පවත්වයි. ආණ්ඩුව එසේ කරන්නේ බුද්ධාගමට හුහක් වැඩකරනවායැයි, මහජනයා රැවටීමටය."*

*"...ආණ්ඩු පක්ෂය ද ලේක්හවුස් පත්‍ර ද ඇමෙරිකන් ජීවිතය හුවා දක්වති. ලේක් හවුස් පත්‍ර කාමභෝගීන් ද බේබද්දන්ද පල්හෝරුන් ද ශ්‍රේෂ්ඨ අය මෙන් හඳුන්වා දෙති. නමුත් ජාති හිතෛශීන්, අමද්‍යප වීරවරයන් බෞද්ධ පින්වතුන් පහත් අය මෙන් පෙන්වා දෙති. කොටින් කියතොත් ලේක්හවුස් පත්‍ර බෞද්ධ විරෝධී හා ජාති විරෝධී බලකොටුයි...."*

*"... බුද්ධ ශාසනය වළලා දැමීමට රෝමානු කතෝලික සභාව උගුල් අටවද්දී ආණ්ඩු පක්ෂය නිශ්ශබ්ද වන්නේ ඔවුන්ගෙන් අයුතු වාසි ලැබෙන නිසාය. ආණ්ඩුපක්ෂයේ කීප පොලක් විසින් මට දන්වා තිබෙන අන්දමට ලබන මැතිවරණයට රෝමානු කතෝලික සභාව කොන්දේසි කීපයක් පිට රුපියල් දස ලක්ෂයක් ආණ්ඩු පක්ෂයට දී තිබේ. මේ කරුණුවලින් ඔප්පුවන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක සිටගෙන අපේ ආණ්ඩු පක්ෂය එක් අතකින් බුද්ධශාසනය ගසාකයි. අනික් අතින් රෝමානු කතෝලික ආගමට බලතල දෙයි. එම නිසා රාජ්‍යයෙන් බුද්ධශාසනය වෙන්කොට එය රැකබලා ගැනීම ගිහි පැවිදි උතුමන්ට භාරදිය යුතුය. එසේම අපේ බාල පරම්පරාව මිෂනාරි පාලනයෙන් බේරාගත යුතුයි.."*

මෙත්තානන්ද මහතාගේ මේ චෝදනාව හා කරුණු දැක්වීම අදටත් එසේම වලංගු බව සනාථ වන්නේ, දෙමළ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය සම්බන්ධයෙන් මෙරට දේශපාලනය හැසිරෙන වංචාසහගත ආකාරය ගැන විමසිලිමත්වන විටය. මෙත්තානන්ද මහතා මූලික වශයෙන් කරුණු 3 ක් ගෙනහැර දක්වයි. ක්‍රිස්තියානි සංස්කෘතියේ ඉලක්ක සපුරා ගැනීම පිණිස මිෂනාරි පාලනය සූක්ෂමව ක්‍රියාත්මකවන බව, රට රැකවරණ සපයමින් හා ආධාර කරමින් මෙරට ජනතාව රැවටීම මේ දේශපාලනයේ ගති සොබාව බව හා ඒ වංචාවට හා රැවටීමට අනුබලදී එය නඩත්තු කිරීම ලේක්හවුස් මාධ්‍ය සම්ප්‍රදය බව, එකී කරුණු වේ. 1956 දී පැවති මේ තත්ත්වය, අද වනවිට වඩාත් දරුණු වී, මුහුණුවර වෙනස්වීම පමණකි, සිදුවී ඇත්තේ.

කඩයිමක් ලෙස සලකනවිට 1505 සිට මේ රටේ සිංහල බෞද්ධයන්ට සිදුවන ආසාධාරණය යටගසමින් ද මේ රටේ අනන්‍යතාවයට මුළුමනින්ම එරෙහිව යමින් ද වෙනම දෙමළ රටක් බිහිකරන ඉලක්කය අද ත්‍රස්තවාදය හරහා මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය හරහා ද සිය අඩු පඩු විහාදගෙන ඇත. ඒ ඉලක්කය වෙනුවෙන් එක් පැත්තකින් දෙමළ කොටි ත්‍රස්තවාදීන්ද අනෙක් පැත්තෙන් ඊළම පිළිගත් හා මෙරට දෙමළ නිජබිමක් ඇතැයි කියන දෙමළ දේශපාලන පක්ෂ ද ඒ මිත්‍යාව වපුරන එන්. ජී. ඕ. ව්‍යාපාරද අද එළිපිටම, ප්‍රසිද්ධියේම, ක්‍රියාත්මක වෙයි.

ප්‍රජාතන්ත්‍රවාදය මත සිටගෙන තම බලය තහවුරු කර ගන්නට මාන බලන ප්‍රධාන පක්ෂ දෙකම අද කරන්නේ, එකී දෙමළ ජාතිවාදයට රහසේ අනුබල දෙමින් ඡන්දය ලබාගැනීමට පමණක් මෙරට අතිබහුතරය වන සිංහල බෞද්ධ ජනතාව රවටා තබාගැනීම බව මේ මැතිවරණ සමය විසින් ද නැවත නැවතත් තහවුරු කරනු ලබයි. සිංහල බෞද්ධ ජාතිකත්වය තබාගැනීම මගින් රනිල් වික්‍රමසිංහ මහතා ද දෙමළ බෙදුම්වාදය සාධාරණීකරණය කර ඇත. මෙය හයවන ආණ්ඩුක්‍රම සංශෝධනයට ද පටහැනි වන්නකි. මේ දේශය තුළ වෙනම රටක් පිටුවීමට කෙළින්ම හෝ අන්‍යාකාරයකින් අනුබල දීම, ආධාර කිරීම, අනුග්‍රහ දැක්වීම මුදල් යෙදීම හා ධෛර්යදීම හෝ දේශනා කිරීම සිරගතවීමට අමතරව ප්‍රජා අයිතිය අහෝසි වීමටත් සියලු දේපල රාජසන්තකවීමටත් තරම් බරපතල වරදක් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හයවැනි සංශෝධනය මගින් පෙන්වා දෙයි. මහනායක හිමිවරු විමසන ප්‍රශ්නයට ප්‍රධාන පක්ෂ දෙකම හොරගල් අහුලන්නේ, රටේ මූලික නීතියෙන්ම එවැනි පදනමක් තිබියදීය. මෙත්තානන්ද මහතා කථා කරන 56 තත්ත්වය අද පරිවර්තනය වී ඇත්තේ එවැනි දරුණු පියවරක් වෙතටය.

මත පිහිටා රටේ ප්‍රශ්න විසඳීමට පියවරගත යුත්තේ, එය රට ගොඩනැගීමට ඇති පදනමත් අනෙකුත් ජනවර්ගවල අයිතිවාසිකම් සුරක්ෂිත වන පදනමත් නිසා බව මෙරට ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එළිපිටම ප්‍රකාශ නොකරන්නේ ඇයි? දෙමළ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය සම්බන්ධව ප්‍රධාන පක්ෂ දරණ ස්ථාවරය විවෘතව රට හමුවේ තබන ලෙස ත්‍රෛනිකායික මහනාහිමිවරු කළ ඉල්ලීම ගැන පො.එ.පෙ. නායකත්වය හා එ.ජා.ප. නායකත්වය එතරම් තැකීමක් නොකිරීමෙන් සනාථ වන්නේ, සිංහල බෞද්ධ ජාතිකත්වයට එරෙහි බලවේගවල වුවමනාවන් වෙනුවෙන් තමන් පෙනී සිටින බව ද?

ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය පසුගියද ලන්ඩනයේදී, බී. බී. සී. ආයතනය සමග පැවති සාකච්ඡාවකදී, "සිංහල ආණ්ඩුවලින් දෙමළ ජනතාවට අසාධාරණයක් වුණා" යැයි කීම එක් පැත්තකින් දෙමළ බෙදුම්වාදය සාධාරණීකරණය කරන්නට 94 දී සිට ඇය යොදාගන්නා එන්.ජී.ඕ. මතවාදය තවමත් අත් නොහැර ඇති බව අඟවන්නකි. අනෙක් අතට දෙමළ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදයේ ක්‍රියාවන්, එකහෙළාම අනුමත කරමින් වෙනම රටක අවශ්‍යතාව එළිපිටම කථාකරන ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ප්‍රමුඛ දෙමළ සන්ධානය එක්සත් ජාතික පක්ෂය සමග එකට

මෙත්තානන්ද මහතාගේ චෝදනාවට ලක්වූ ලේක්හවුස් මාධ්‍ය සම්ප්‍රදය අඩුවැඩි වශයෙන් අද සියලුම මාධ්‍යවලට බෝවී තිබීම එදාට වඩා අද දක්නට ඇති අනෙක් වෙනස වේ. මේ මැතිවරණය තුළ දෙමළ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදීන්ට මතුවීමට ඇති ඉඩකඩ විමසනවාට වඩා මැතිවරණයේ පිරිසිදු භාවය ගැන විමසීම මාධ්‍ය පළමුතැනට ගන්නේ එබැවිනි. අනෙක් අතට මැතිවරණයේ පිරිසිදුභාවය මැනීම කවර මිනුමකට සාපේක්ෂ වූවක්ද කියාවත් මේ මාධ්‍ය විසින් විමසනු ලබන්නේ නැත. එහෙත් මේ මාධ්‍ය මැතිවරණයේ පිරිසිදුභාවය තීන්දු කරන්නේ පැෆරල් සංවිධානයට සාපේක්ෂව බව ඇතැම් මුද්‍රිත මාධ්‍ය හා විශේෂයෙන්ම විද්‍යුත් මාධ්‍ය ඒ සංවිධානයට දක්වන ඉහළ සැලකිල්ල මගින් සනාථ වෙයි. මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයන් වන ග්‍රොඩ්ප්‍රි ගුණතිලක හා ජේ. සෙල්වරාජන්, මැග්සයිසේ සම්මානලාභී, ඒ. ටී. ආරියරත්න, බ්‍රැඩ්මන් වීරකෝන් දකුණු ආසියා ජාත්‍යන්තර සහයෝගිතාවයේ සභාපතිනි ජෙසීමා ස්ටයිල්, දීපිකා උඩගම ක්‍රිස්තියානි සභාවේ කොළඹ අගරදගුරු දුලිප් චිකේරා හා සූරියා වික්‍රමසිංහ යන මහත්ම මහත්මීන් මැතිවරණයේ සාධාරණ බව නිරීක්ෂණය කරන විද්වත් මඩුල්ල ලෙස පැෆරල් සංවිධානය විසින් නම් කර තිබීම මගින් එම සංවිධානය පෙනී සිටින්නේ සිංහල බෞද්ධ ජාතිකත්වයට සාපේක්ෂවද නැතිනම් ඊට එරෙහි බලවේගයට සාපේක්ෂවද යන්න ඉතා පැහැදිලිව පෙන්වා ඇත. ඒ හැරුණු විට මේ මාධ්‍යවලට දෙමළ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය පෝෂණය කරන සාම ජාවාරම් කරුවන්ගේ මතවාදවලට ඉඩදීමද එමගින් රටටට සිදුවන බරපතල හානිය හුවාදක්වනවාට වඩා වැදගත්ය. මේ මාධ්‍ය අද 56 ලේක්හවුස් සම්ප්‍රදය තමන්ට වැළඳී ඇති සැටි එසේ සනාථ කිරයි.

1956 දී මතුවූ බෞද්ධ ප්‍රබෝධයට, පෙළගැසුණු සිංහල බලවේගයට, ඉදිරියට ආ සිංහල බෞද්ධ ජාතිකත්වයට, ලේක්හවුස් මාධ්‍ය මගින් ඉඩ අහුරාගත් ආකාරය වත්මන් මාධ්‍ය වඩාත් පැතිරුණු ලෙස ක්‍රියාවට නගන්නෙ, එන්. ජී. ඕ. ව්‍යාපාර විසින් නඩත්තු කරනු ලබන මාධ්‍ය සංවිධාන ඒවායේ මතවාද එකී මාධ්‍යවල හරය ලෙස ගනිමිනි. එහෙත් රටේ වාසනාවට මෙරට අතිබහුතර ජනතාව මහනායක හිමිවරුන්ගේ හඬට කන්දෙන තීරණාත්මක ස්වරූපයෙන් මේ මාධ්‍යවල හඬට කන්දීමක් නැත. දෙමළ බෙදුම්වාදීන් සම්බන්ධ ප්‍රධාන පක්ෂවල ස්ථාවරය වහාම රටට හෙළිකරන ලෙස දන්වමින් මහනායක හිමිවරු කළ නිවේදනය, තම රැකවරණය වෙනුවෙන්ම ලහම ඥාතියෙකු කළ ප්‍රකාශයක් ලෙසින් රටේ අති බහුතර ජනතවාට හැඟී ගියේ එබැවිනි. ඒ හැඟීම ජාතික මෙහෙවරට ඉලක්ක කිරීම යට ගැසූ මාධ්‍යවල හඬට වඩා මහා සංඝරත්නයේ හඬ රටේ ප්‍රබල බව පො.එ.පෙ. හා එජාපය යන ප්‍රධාන පක්ෂ දෙකේ නායකත්වයේ අශිර්වාදයත් සහයෝගයත් ඇතිව සැකසුණු පැකේජය හෙවත් දෙමළ බෙදුම්වාදය නීතිගත කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ සම්මත කරන්නට ඉඩ නොදීම මගින් සනාථ කෙරිණි.

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය හා පාර්ලිමේන්තුව නොව ඊට බාහිරව ඇති සිංහල බලවේගයත් ඊට නායකත්වය දෙන මහාසංඝරත්නයත්, සිංහල බෞද්ධ ජාතිකත්වයට හිමි තැන දිනා ගැනීමට නිබඳව අරගලයක නියැලී සිටින බව නොවේද මෙයින් සනාථ වන්නේ. 56 ජාතික පිබිදීම හරහා බලයට පත් නව ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිකම බරගන්නැයි කළ අරාධනාව මෙත්තානන්ද මහතා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවේ ලංකාවේ ජාතික සටනට අනුග්‍රහයක් උදදව්වක් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයෙන් හෝ පාර්ලිමේන්තුවෙන් නොලැබෙන බව වටහාගෙන විය යුතුය. 1505 සිට සිංහලයාට අත්විඳින්නට සිදුවූ අසාධාරණය නිවැරැදි කරන හා රට ගොඩනැගිය හැකි පදනම වන සිංහල බෞද්ධ ජාතිකත්වයට හිමි තැන දිනා ගැනීමේ ජාතික බලවේගය තවමත් ක්‍රියාත්මක වන්නේ ප්‍රජාතන්තවාදී දේශපාලනයෙන් හා පාර්ලිමේන්තුවෙන් පිටත් වේ.